(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 90. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 ඔක්තෝබර් 10 සිකුරාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) දම්මික පටබැඳි මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) කෞශල්‍යා ආරියරත්න මෙනෙවිය,** ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමිය

ගරු **අර්කම් ඉල්යාස් මහතා,** බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිශාන්ත ජයවීර මහතා,** ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) හංසක විජේමුණි මහතා,** සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) මධුර සෙනෙවිරත්න මහතා,** අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **ජේ.සී. අලවතුවල මහතා**

ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා

ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා

ගරු කේ. ඉලංකුමාරන් මහතා

ගරු එම්.එස්. උදුමාලෙබ්බේ මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු රවී කරුණානායක මහතා

ගරු ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය

ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා

ගරු උපුල් කිත්සිරි මහතා

ගරු කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා

ගරු චමින්ද ලලිත් කුමාර මහතා

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු එම්.ඒ.සී.එස්. චතුරි ගංගානි මහත්මිය

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු දිලිත් ජයවීර මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු ජීවන් තොන්ඩමන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු චානක මාදුගොඩ මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා

ගරු ඉස්මායිල් මුත්තු මොහොමඩ් මහතා

ගරු ධනුෂ්ක රංගනාත් මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

**ගරු මනෝජ් රාජපක්ෂ මහතා**

**ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**

**ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය**

**ගරු නයන වාසලතිලක මහතා**

**ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා**

**ගරු කංචන වැලිපිටිය මහතා**

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු ආර්.ජී. විජේරත්න මහතා**

**ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා**

**ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා**

**ගරු චමින්ද විජේසිරි මහතා**

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**

**ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා**

**ගරු ෆස්මින් ෂරීෆ් මහතා**

**ගරු තිළිණ සමරකෝන් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු නීතිඥ අර්ජුන සුජීව සේනසිංහ මහතා**

**ගරු (වෛද්‍ය) ජනක සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවූෆ් හකීම් මහතා**

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

චමින්ද කුලරත්න මහතා, වැඩ බලන පාර්ලිමේන්තුවේ මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** කථානායකවරයා විසින් මතු සඳහන් නිවේදනය කරන ලදී:—

"ගරු මන්ත්‍රීවරුනි,

2025 ඔක්තෝබර් මස 7 වන දින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් මතු කරන ලද වරප්‍රසාද ප්‍රශ්නය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 29(1) ප්‍රකාරව සමස්තයක් ලෙස පාර්ලිමේන්තුවේ වරප්‍රසාද සම්බන්ධයෙන් අදාළ වන බැවින් ඒ සම්බන්ධයෙන් මගේ තීන්දුව ප්‍රකාශ කිරීමට කැමැත්තෙමි. 2024 ඔක්තෝබර් මස 24 වන දින අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට අපේක්ෂකයෙකු නම් කිරීමේ ක්‍රියාවලියේදී පාර්ලිමේන්තුවේ සභානායකවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නොමඟ යවනු ලැබ ඇති බවත්, එමඟින් පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ 'අ' උපලේඛනයෙහි 4 වන වගන්තිය යටතේ වරප්‍රසාද කඩ කිරීමක් සිදු කර ඇති බවත් ගරු මන්ත්‍රීවරයා විසින් චෝදනා කරන ලදී. එබැවින් මෙම කාරණය විමර්ශනය සඳහා පාර්ලිමේන්තු වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස ගරු මන්ත්‍රීතුමා විසින් ඉල්ලා සිටින ලදී.

මෙම කාරණය හොඳින් සලකා බැලීමෙන් පසු, මම දැන් මගේ තීන්දුව ලබා දීමට කටයුතු කරමි.

**<u>ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ ස්වභාවය</u>**

තීරණය කළ යුතු පළමු ගැටළුව වනුයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව යනු පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ විධිවිධාන අදාළ කර ගත හැකි පාර්ලිමේන්තු කාරක සභාවක් ද යන්නයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාව යටතේ, සුවිශේෂ සහ ස්වාධීන ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්ථාපිත කරනු ලැබ ඇත. එය අග්‍රාමාත්‍යවරයා, කථානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ජනාධිපතිවරයා විසින් නම් කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු සහ අග්‍රාමාත්‍යවරයා සහ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයාගේ නාමයෝජනා මත ජනාධිපතිවරයා විසින් පත් කරන ලද නිල බලයෙන් හෝ සිවිල් සමාජයෙන් පත් කරන ලද තවත් සාමාජිකයින් කිහිප දෙනෙකුගෙන් සමන්විත වේ.

එබැවින්, එය පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග යටතේ පිහිටුවන ලද පාර්ලිමේන්තු කාරක සභාවක් නොවේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ක්‍රියාත්මක වනුයේ පාර්ලිමේන්තුවේ හෝ එහි ස්ථාවර නියෝගවල අධිකාරිත්වය යටතේ නොව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේම ප්‍රතිපාදන මතය. එබැවින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ගනු ලබන කිසියම් ක්‍රියාමාර්ගයක් හෝ තීරණයක් පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ අර්ථය තුළ පාර්ලිමේන්තුව හෝ පාර්ලිමේන්තු කාරක සභාවක් විසින් ගනු ලබන ක්‍රියාමාර්ග ලෙස සැලකිය නොහැකි ය.

**<u>පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ 'අ' උපලේඛනයෙහි 4 වන වගන්තියෙහි අදාළත්වය</u>**

පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ 'අ' උපලේඛනයෙහි 4 වන වගන්තිය මඟින් පාර්ලිමේන්තුව හෝ පාර්ලිමේන්තුවේ කාරක සභාවක් නොමඟ යැවීම හා සම්බන්ධ වැරදි සම්බන්ධයෙන් විධිවිධාන සලසනු ලැබේ. ම'විසින් දැනටමත් ප්‍රකාශ කර ඇති පරිදි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පාර්ලිමේන්තුවේ කාරක සභාවක් නොවන බැවින්, ඉහත කී විධිවිධානය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ කාර්යයන් හෝ විමසා බැලීම් සඳහා අදාළ නොවේ.

ඒ අනුව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඉදිරියේ වැරදි හෝ නොමඟ යවන සුළු ප්‍රකාශයක් කරන ලද බවට චෝදනා එල්ල වුවද, එවැනි හැසිරීමක් එකී පනතේ 'අ' උපලේඛනයේ 4 වන වගන්තිය මඟින් අදහස් කරන පරිදි පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කරනු ලැබීමක විෂය පථයට අයත් නොවේ.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීරණවල අවසානාත්මකභාවය**

තවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීරණ අවසානාත්මක සහ තීරණාත්මක වන බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ඒ ව්‍යවස්ථාව තුළ ප්‍රකාශිතවම සඳහන් වන අතර, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් පිළිබඳව චෝදනා කරනු ලබමින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරි පත් කරන ලද අයදුම්පතක් මඟින් හැර, එකී තීරණ කිසිදු අධිකරණයක හෝ විනිශ්චය සභාවක ප්‍රශ්න නොකළ යුතු ය.

එම පත්කිරීමට අදාළව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයින් වගඋත්තරකරුවන් ලෙස නම් කරමින් මූලික අයිතිවාසිකම් අයදුම්පත් තුනක් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කරන ලද බවට මා දැනුවත් වී ඇත. පසුව, තවදුරටත් ඉදිරියට කටයුතු කිරීමකින් තොරව පෙත්සම්කරුවන් විසින් එම අයදුම්පත් ඉල්ලා අස්කර ගෙන ඇති බව ද නිරීක්ෂණය වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීරණයට එරෙහිව අභියෝග කිරීමේ නිසි ව්‍යවස්ථාමය යාන්ත්‍රණය පාර්ලිමේන්තුව තුළ නොව ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පවතින බව මෙමඟින් සනාථ වේ.

**තීරණය**

ඉහත සඳහන් කළ පරිදි, කරුණු සලකා බැලීමෙන් අනතුරුව පහත සඳහන් මතයට මා විසින් එළඹෙනු ලැබේ:

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පාර්ලිමේන්තු කාරක සභාවක් නොවන අතර එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41අ ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කරන ලද සුවිශේෂ ආයතනයකි;

2. එබැවින්, පාර්ලිමේන්තු (බලතල සහ වරප්‍රසාද) පනතේ 'අ' උපලේඛනයෙහි 4 වන වගන්තියේ විධිවිධාන එහි කටයුතු සඳහා අදාළ නොවේ;

3. ගරු මන්ත්‍රීවරයා විසින් එල්ල කරන ලද චෝදනාවෙන් පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීම පිළිබඳ ප්‍රශ්නයක් අනාවරණය නොවේ;

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ තීරණ සම්බන්ධයෙන් වූ කිසියම් දුක්ගැනවිල්ලක් හෝ අභියෝගයක් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 ව්‍යවස්ථාව යටතේ ඇති ව්‍යවස්ථාමය ප්‍රතිකර්මය යොදා ගනිමින් කටයුතු කළ යුතු වේ.

ඒ අනුව, මෙම කාරණයේදී කිසිදු වරප්‍රසාද ප්‍රශ්නයක් මතු නොවන බවට ම'විසින් තීරණය කරනු ලබන අතර, එසේ හෙයින්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් මතු කරන ලද ගැටළුව ආචාරධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු නොකරනු ඇත."

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ X, XI, XII, XIII, XIV හා XV කොටස්, සිව්වැනි කාණ්ඩයේ V කොටස සහ හයවැනි කාණ්ඩයේ I, II, III හා IV කොටස් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දසවැනි කාණ්ඩයේ —

(i) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ මාර්ගගත වීසා නිකුත් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ විශේෂ විගණන වාර්තාව;

(ii) සේවය හැරගිය රජයේ වෛද්‍ය නිලධාරින්ගෙන් රජයට අයවිය යුතු හිඟ මුදල් හා විදෙස් පුහුණුව ලද විශේෂඥ වෛද්‍ය නිලධාරින් අනුයුක්ත කිරීම සම්බන්ධයෙන් වූ විශේෂ විගණන වාර්තාව; සහ

(iii) 2022 හා 2023 වර්ෂවල ඖෂධ අවශ්‍යතාවය, ප්‍රසම්පාදනය, සැපයුම, බෙදාහැරීම හා නියාමනය පිළිබඳ විශේෂ විගණන වාර්තාව (දෙවැනි කොටස)

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව —

(i) 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXIII කොටස;

(ii) 2022 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ LXVI කොටස;

(iii) 2023 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLVIII කොටස; සහ

(iv) 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VIII, XII, XIII, XIV හා XV කොටස්, තෙවැනි කාණ්ඩයේ X, XI, XII හා XIII කොටස් සහ නවවැනි කාණ්ඩයේ VI හා VII කොටස්

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(4) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් 2023 වර්ෂය සඳහා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව පරිසරය, කෘෂිකර්මය සහ සම්පත් තිරසාරත්වය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** කම්කරු කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2023 වර්ෂය සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(ii) 2023 වර්ෂය සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2022 වර්ෂය සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iv) 2022 වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව; සහ

(v) 2023 වර්ෂය සඳහා ශ්‍රම වාසනා අරමුදලේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) රත්ගම, රණපනාදෙනිය, රන්සිරි උයන යන ලිපිනයෙහි පදිංචි ඩී.එච්. තිලක් දේශප්‍රිය මහතාගෙන් ලැබුණු 2025.06.16 දිනැති පෙත්සම;

(ii) පිටිවැල්ල, ධීවර නිවස, ඔරොප්පු වත්ත, අංක 13 දරන ස්ථානයෙහි පදිංචි නිපුල් වඩුගේ මහතාගෙන් ලැබුණු 2025.06.15 දිනැති පෙත්සම; සහ

(iii) තල්පේ, කන්දෙවත්ත, හීනටිගල දකුණ යන ලිපිනයෙහි පදිංචි යූ.කේ. විජේසිරි මහතාගෙන් ලැබුණු 2025.06.08 දිනැති පෙත්සම

ගරු රත්න ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) වාද්දුව, දකුණු තල්පිටිය, දළදා වත්ත පටුමග, අංක. 19/3 E දරන ස්ථානයෙහි පදිංචි චන්ද්‍රිකා ද සිල්වා මහත්මියගෙන් ලැබුණු 2025.06.09 දිනැති පෙත්සම ගරු අජිත් පී. පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(3) දොඩම්ගස්ලන්ද, ලිහිණිවැහැර ජනපදය යන ලිපිනයෙහි පදිංචි පී.ඒ. ලලිත් ෆ්‍රැන්සිස් මහතාගෙන් ලැබුණු 2025.06.30 දිනැති පෙත්සම ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා විසින් පිළිගන්වන ලදී.

(4) (i) වාද්දුව, පොතුපිටිය උතුර, රවුම් පාර, අංක 15 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එච්. ගාමිණී කීර්තිරත්න මහතාගෙන් ලැබුණු 2025.06.16 දිනැති පෙත්සම; සහ

(ii) කොළඹ 10, මරදාන, පොලිස් නිවාස, අංක 12 එච් දරන ස්ථානයෙහි පදිංචි නදීප් කාවින්ද සිල්වා මහතාගෙන් ලැබුණු 2025.06.16 දිනැති පෙත්සම

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය විසින් පිළිගන්වන ලදී.

(5) උඩතලවින්න, ගලදෙනිය මඩිගේ, අංක 13 දරන ස්ථානයෙහි පදිංචි ජේ. ජමාල්ඩීන් මහතාගෙන් ලැබුණු 2025.06.06 දිනැති පෙත්සම ගරු ඊ.එම්. බස්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(6) (i) වලල්ලාවිට, මගුරුමස්විල, පාසල් මාවත යන ලිපිනයෙහි පදිංචි ඒ.එම්. බේබි නෝනා මහත්මියගෙන් ලැබුණු 2025.06.13 දිනැති පෙත්සම;

(ii) බදුරලිය, හැඩිගල්ල ජනපදය යන ලිපිනයෙහි පදිංචි බී.එල්. අභයපාල මහතාගෙන් ලැබුණු 2025.05.19 දිනැති පෙත්සම; සහ

(iii) පැලවත්ත, ගල්ලෙන මුල්ල, අංක 46 දරන ස්ථානයෙහි පදිංචි කේ.ටී. පියසේන මහතාගෙන් ලැබුණු 2025.04.07 දිනැති පෙත්සම

ගරු ධනුෂ්ක රංගනාත් මහතා විසින් පිළිගන්වන ලදී.

(7) මාවනැල්ල, දෙහිමඩුව, අම්බුලුගල පාර, අංක සී/174 දරන ස්ථානයෙහි පදිංචි කේ. ජයන්ත කුමාර මහතාගෙන් ලැබුණු 2025.06.15 දිනැති පෙත්සම ගරු කංචන වැලිපිටිය මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**5. පාර්ලිමේන්තුවේ වැඩකටයුතු:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයේ විෂය අංක 1, 2, 3, 4, 5 සහ 6 පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 24(2) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම්:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 3.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකවරයා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. වරප්‍රසාද:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නලින් හේවගේ මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 ජූලි 09 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.12 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

**8. රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම:** ගරු හේෂා විතානගේ අංකුඹුර ආරච්චි මහතා, ගරු චාමර සම්පත් දසනායක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින්, රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා. 7/2024)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පිටිගල, උඩුගම, නෙලුව සහ දෙණියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කිරීම:** ගරු ටී. කේ. ජයසුන්දර මහතා, ගරු ලාල් ප්‍රේමනාත් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකාව නව පුනරුදයකට අවතීර්ණ වී ඇති අවස්ථාවක රටේ සංචාරක ව්‍යාපාරය දේශීය ආදායම ඉහළ නැංවීමට හේතු වන හෙයින්ද, ශ්‍රී ලංකාවේ පහතරට වැසි වනාන්තර අතරින් ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරයද, විශේෂිත සත්ත්ව හා ශාක විශේෂවලින් ගහන වූ කන්නෙලිය වනාන්තරය සහ හිනිදූම කන්ද ඇතුළත් කඳුවැටියේ (හේකොක්) ජෛව පද්ධතිය විදේශීය ජනතාවගේ විශේෂ අවධානය දිනාගත් පරිසර පද්ධතියක් වන හෙයින්ද, මෙම පරිසර පද්ධතිය ඇතුළත් පිටිගල, උඩුගම, නෙලුව සහ දෙනියාය නගර අයත් පරිසර පද්ධතිය සංචාරක කලාපයක් ලෙස නම් කර එය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා. 40/2025)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. පාසැල් විෂය මාලාවට නීතිය සහ ආචාර ධර්ම ඇතුළත් කිරීම:** ගරු රුවන් මාපලගම මහතා, ගරු නිතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— මෙරට පොදු ජනතාව මුහුණ දෙන එදිනෙදා ගැටලුවලට ප්‍රධාන හේතුවක් ලෙස එදිනෙදා ජීවිතයට අවශ්‍ය මූලික නීතිය පිළිබඳ නොදැනුවත්කම හඳුනාගෙන ඇති හෙයින් ද, නීතිය නොදැන සිටීම නීතිය ඉදිරියේදී නිදහසට කරුණක් නොවන හෙයින්ද, පාසැල් විෂය මාලාව සංකීර්ණ වීම වළක්වා ගනිමින් 6 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා පාසැල් දරුවන්ගේ පුරවැසි අධ්‍යාපනය විෂය නිර්දේශයට රටේ මූලික නීතිය පිළිබඳ ඉගැන්වීම් ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා. 42/2025)

“ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරිය විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.46 ට ගරු චානක මාදුගොඩ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**11. ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වැඩසටහනක් සකස් කිරීම:** ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා, ගරු හෙක්ටර් අප්පුහාමි මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ජාතික ඖෂධ තත්ත්ව ආරක්ෂණ පරීක්ෂණාගාරය පිහිටුවා මේ වන විට වසර 35ක් පමණ ගතවී ඇති හෙයින්ද, එම පරීක්ෂණාගාරය මේ වන විට නිසි පරිදි ක්‍රියාත්මක නොවන හෙයින්ද, ආනයනික ඖෂධ වැඩි ප්‍රමාණයක් නිසි තත්ත්ව පරීක්ෂාවකට ලක් නොවන හෙයින්, එම තත්ත්වය වළක්වා ගැනීම සඳහා නිසි වැඩසටහනක් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා. 46/2025)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**12. ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කිරීම:** ගරු රෝහණ බංඩාර මහතා, ගරු ගයන්ත කරුණාතිලක මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— රටක ගොවි ජනතාවගේ සුභසාධනය සැලසීම රජයක වගකීම වන හෙයින්, මෙරට ජනයාගෙන් බහුතරයක් වන ගොවි ජනතාව වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ඇති කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි. (පා. 47/2025)

“ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය”යි පරිසර අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.06 ට ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**13. කල් තැබීම (ජාතික පොලිස් කොමිෂන් සභාවේ ස්වාධීනත්වය තහවුරු කිරීම):** “මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය” යි පරිසර අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් අද දින සභා සම්මතිය අනුව පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 ඔක්තෝබර් 21 අඟහරුවාදා පූ. භා. 9.30 වනතෙක් කල් ගියේ ය.